# රජයේ සේවක
# දුම්රිය ගමන් බලපත්‍ර

## නිවාඩු ගමන්

රාජ්‍ය සේවය පිණිසයි

01




photo courtesy- Daminda Prasangika

රාජ්‍ය සේවය පිණිසයි

# රජයේ සේවකයෙකු එක් ලිත් වර්ෂයක් සඳහා පහත පරිදි නිදහස් දුම්රිය බලපත්‍ර හිමිවේ.

ස්ථිර පත්වීමක් සහිත නිලධරයෙකුට නිවාඩු ගමන් බලපත්‍ර කට්ටල 03 කි.

මාසික වැටුප ලබන වසරක සේවා කාලයක් සහිත තාවකාලික නිලධරයෙකුට, අනියම් නිලධරයෙකුට හෝ අනියම් නිවාඩු හිමි දවස් පඩි ලබන නිලධරයෙකුට කට්ටල එකකි.

රාජ්‍ය සේවය පිණිසයි

නැවත සේවයේ යෙදවූ විශ්‍රාමික නිලධරයෙකුට කට්ටල 03 කි.

විශ්‍රාම ලැබූ නිලධරයෙකුට බලපත්‍ර කට්ටල 03 කි.




photo courtesy- Daminda Prasangika

රාජ්‍ය සේවය පිණිසයි

දුම්රිය බලපත්‍ර කට්ටලයක් යනු, යෑමට දෙන බලපත්‍රයක් සහ ඒමට දෙනු ලබන බලපත්‍රයකි.
ඒ අනුව බලපත්‍ර කට්ටල 03 ක් යනු, වර්ෂයක් ඇතුළත යෑමට  බලපත්‍ර 03ක් සහ ඒමට බලපත්‍ර 03 කි.

යම් අවස්ථාවක සම්පූර්ණ ලිත් වර්ෂයම සේවය කර නැති හෝ සේවය කිරීමට බලාපොරොත්තු නොවන නිලධරයන් සඳහා ඔහු සේවය කරන ලද හෝ සේවය කිරීමට බලාපොරොත්තු වන කාල සීමාවට අනුපාතික කර දුම්රිය බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

රජයේ නිලධරයෙකුට දුම්රිය බලපත්‍ර සම්බන්ධව ඇති හිමිකම එම නිලධරයාගේ පවුලේ එක් එක් සාමාජිකයාටද තිබේ.



photo courtesy- Daminda Prasangika

රාජ්‍ය සේවය පිණිසයි

දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී නිලධරයාගේ පවුල යනුවෙන් අදහස් කරන්නේ, නිලධරයාගේ කලත්‍රයා (සැමියා හෝ බිරිඳ) සහ නිලධරයාගෙන් යැපෙන දරුවන් ය.

දරුවන් සඳහා වයස් සීමාවක් බලපාන්නේ නැත. නමුත් ඔවුන් නිලධරයාගෙන් යැපෙන බව තහවුරු කළ යුතුය.

අවිවාහක හෝ වැන්දඹු නිලධරයෙක් නම් ඔහුගේ පවුල වශයෙන් දෙමාපියන් සහ ඔහුගෙන් යැපෙන්නා වූ සහෝදර සහෝදරියන් සැළකේ. මෙහි සහෝදර සහෝදරියන් සංඛ්‍යාවට සීමාවක් නොමැත.

මෙහිදී සහෝදරිය යන්නට වැන්දඹු සහෝදරියක් අයත් නොවේ.




photo courtesy- Daminda Prasangika

රාජ්‍ය සේවය පිණිසයි

සැමියා සහ බිරිඳ දෙදෙනාම රජයේ සේවකයන් නම් බලපත්‍ර ලබාගත හැක්කේ එක් අයෙකුට පමණි. එහිදී දෙදෙනාගෙන් වැඩි වාසිසහගත නිලධරයාට බලපත්‍ර ලබාගත හැක.

එකම පවුලේ කිහිප දෙනෙකු රජයේ නිලධරයන්වන විට එක් අයෙකුට පමණක් බලපත්‍ර ලබාගත හැක.

අඹු සැමියන් දෙදෙනාම රජයේ නිලධරයන් වනවිට දෙදෙනාගෙන් කවුරුන් බලපත්‍ර ලබාගත්තද ඉල්ලුම් කළ යුත්තේ ස්වාමිපුරුෂයා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙතිනි.

ආයතන ප්‍රධානියාට අවශ්‍ය නම් යැපීම් තහවුරු කර ගැනීමට ග්‍රාම නිලධාරී වාර්තාවක් කැඳවිය හැකිය.



photo courtesy- Daminda Prasangika

රාජ්‍ය සේවය පිණිසයි

## -දුම්රියේ ගමන්කළ හැකි පන්ති-

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | දෙවන පන්තිය |
| ද්විතියික ශ්‍රේණිය | - | පළමු පන්තිය |
| මාණ්ඩලික ශ්‍රේණිය | - | පළමු පන්තිය |

යම් නිලධරයෙකුට තමාට හිමි පන්තියට වඩා ඉහළ පන්තියක ගමන් කිරීමට අවශ්‍ය නම් ඉතිරි මුදල අතින් ගෙවා එහි ගමන් කළ හැක.
එසේම අවශ්‍ය නම් තමාට හිමි පන්තියට වඩා පහළ පන්තියක වුවද ගමන් කළ හැක.




photo courtesy- Daminda Prasangika

දුම්රිය නීතිවලට අනුකූලව නිදන මැදිරි පහසුකම් ලබා ගැනීමටද රජයේ නිලධරයන්ට හැකියාව තිබේ.

පළමු පන්තියේ ගමන් කිරීමට හිමිකම ඇති බලපත්‍රයක් හිමි නිලධරයෙකුට ඒ මගින් වායුසමීකරණය කරන ලද දුම්රියක හෝ නිරීක්ෂණ මැදිරියක හෝ ගමන් කිරීමටද හිමිකම තිබේ.

## -දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීම-

පොදු 21 ආකෘතිපත්‍රය මගින් තම ආයතන ප්‍රධානියාගෙන් දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කළ යුතුය.



photo courtesy- Daminda Prasangika

# -දුම්රිය ගමන් බලපත්‍රයක දිනය-

සෑම ගමන්බලපත්‍රයකම ගමනට යෝජිත දිනය නිශ්පිතවම සඳහන් කළ යුතුය.

බලපත්‍රයක් නිකුත් කළ දිනය සහ ගමන් කිරීමට යෝජිත දිනය අතර උපරිම කාලය දින 30 කි. එසේ වුවද ආපසු පැමිණීම සඳහා නිකුත් කරන බලපත්‍රයේ කාලසීමාව දින 45ක් දක්වා පැවතිය හැක.

එසේ වුවද, බලපත්‍රයේ සඳහන් කර ඇති දිනයට දින 14 ට පෙර හෝ දින 14ට පසුව හෝ දුම්රිය බලපත්‍රය භාවිතා කළ හැකිය.



දුම්රිය බලපත්‍රයක් යනු දුම්රියේ ගමන් කිරීමට ලබාදෙන ප්‍රවේශපත්‍රයන් නොවේ.

දුම්රිය බලපත්‍රය (වොරන්ට්) ලෙස ඔබට කාර්යාලයෙන් අත්සන් කර ලබාදෙන දුම්රිය ඒ.බී.70 ෆෝරමය දුම්රිය ස්ථානයට ඉදිරිපත් කර කලින් ආසන වෙන්කර ගැනීම හෝ ගමන යන දිනයේදීම එය දුම්රිය ස්ථානයේ ප්‍රවේශපත්‍ර කවුලුවට ඉදිරිපත් කර රජයේ මුදලින් ප්‍රවේශපත්‍රයක් ලබා ගැනීම සඳහා ලබාදෙන්නා වූ නීත්‍යානුකූල ලේඛනයකි.

රාජකාරි ගමන් වලදී දුම්රිය බලපත්‍රය ලෙස ලබා දෙන්නේ දුම්රිය ඒ.බී. 70බී ෆෝරමයයි.



# -දුම්රිය බලපත්‍ර මගින් ආසන වෙන්කරවා ගැනීම-

## දුම්රිය බලපත්‍ර මගින් වෙන්කරවාගත හැකි දුම්රිය පහසුකම්.

- දෙවන පන්තියේ ආසන
- පළමු පන්තියේ ආසන
- නිදන මැදිරි
- නිරීක්ෂණ මැදිරි
- වායුසමණය කළ දුම්රිය ආසන
- නගරාන්තර ශීඝ්‍රගාමී දුම්රියවල ආසන
- දෙවන පන්තියේ නිදන ආසන

රාජ්‍ය සේවය පිණිසයි

රාජ්‍ය සේවක දුම්රිය බලපත්‍ර මගින් තුන්වන පන්තියේ ආසන වෙන්කළ නොහැක.




රාජ්‍ය සේවය පිණිසයි

# -දුම්රිය ආසන කලින් වෙන්කරවා ගැනීම-

නිදහස් දුම්රිය බලපත්‍ර මගින් වුවත්, මුදල්වලින් වුවත් ආසන වෙන්කරවා ගැනීම සඳහා පවතින්නේ තරගයකි. මක්නිසාද යත් ආසන සංඛ්‍යාව සීමිත බැවිණි.
යම් දුම්රිය ආසන වෙන්කිරීම ආරම්භ වන්නේ එම දුම්රිය ගමන් කරන දිනයට දින 30ට පෙර එළඹෙන දින පෙරවරු 10.00 සිටයි.

ආසන වෙන්කිරීමට යන ඔබ නිසිපරිදි සම්පූර්ණ කරන ලද දුම්රිය බලපත්‍රයත්, ගමන් කිරීමට බලාපොරොත්තු වන දිනය, දුම්රිය නිවැරදිව සඳහන් කරගෙන යා යුතු අතර දුම්රිය ස්ථානයේදී ලබාදෙන ෆෝරමයේ ගමන් කරන මගීන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක නිවැරදිව සඳහන් කර ආසන වෙන්කිරීමේ නිලධාරියා වෙත ලබා දිය යුතුය.



යම්හෙයකින් ඔබ ලබාගත් දුම්රිය බලපත්‍රයක් භාවිතා නොකළේ නම් කඩිනමින් එය නිකුත්කළ බලධරයා වෙත ලබාදිය යුතුය. (නිවැරදි ක්‍රමය නම් භාවිතා කළ හැකිව පැවති දින සිට දින 03ක් නොඉක්මවා) මෙහිදී භාවිතා නොකළ යන්නෙන් අදහස් කරනු ලබන්නේ එම බලපත්‍රය ලබාදී ආසන වෙන්කර ගැනීමද සිදුකර නොතිබිය යුතුය.

නිදහස් දුම්රිය බලපත්‍රයක් අනිසි ලෙස භාවිතා කිරීම යනු රජයේ නිලධරයෙකුට විරුද්ධව විනය පියවර ගතහැකි විෂමාචාරයකි.

මගීන් සංඛ්‍යාව පිළිබඳව කිසිඳු සීමාවක් නොපනවා රුපියල් දසදහස් ගණනක වටිනාකමක් රජයෙන් දරමින් මෙම නිදහස් දුම්රිය බලපත්‍ර ඔබ වෙත ලබා දෙන්නේ ඔබ රජයේ සේවකයෙකු වශයෙන් දේශයට ඉටුකරනු ලබන සේවය වෙනුවෙන් කෘතගුණ සැලකීමක් ලෙසයි. එබැවින් සීමිත සංඛ්‍යාවකට පමණක් හිමිවන මෙම වරප්‍රසාදය අවංකව භාවිතා කිරීම ඔබගේ යුතුකමක් මෙන්ම වගකීමක්ද වේ.

වැඩි විස්තර සඳහා ආයතන සංග්‍රහය සහ අනුෂංගික චක්‍රලේඛ පරිහරණය කරන්න.

රාජ්‍ය සේවය පිණිසයි

